**නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2021**

----------------------------------------------------------------------------------------------------------------

නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---------------------------------------------------------------------------

ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ රටේ මූල්‍ය හා පරිපාලන නගරවල අධික රථවාහන තදබදය අඩුකිරීම සහ සපයන සේවාව වැඩිදියුණු කිරීමේ අරමුණින් වරාය නගරය, කොළඹ වරාය, මාලබේ අධ්‍යාපන කේන්ද්‍රය සහ බත්තරමුල්ල පරිපාලන කේන්ද්‍රය ඇතුළුව කොළඹ සිට පවතින අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කිරීම මගින් අධිවේගී මාර්ග ජාලයේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. බිලියන 193ක් වූ අතර ප්‍රධාන මංතීරුවේ දිග ආසන්න වශයෙන් කිලෝමීටර 16.4කි. යෝජිත ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පදනම මත නිර්මාණය-ගොඩනැගීම-මූල්‍යායනය-නඩත්තුව මත ක්‍රියාත්මක කිරීමට නියමිත අතර 2025 වන විට වර්ෂ 3ක් ඇතුලත නිම කිරීමට අතර ආයෝජක විසින් වසර 15ක් නඩත්තු කිරීමට නියමිත වේ.

**1.3 මතය**

------

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරිම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම**

---------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති,රීති සහ රෙගුලාසි සමඟ අනුකූල නොවීම**

| | නීති,රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 12 | 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සහ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර යාවත්කාලීන කර නොතිබුණි. | විගණනය මඟින් කරන ලද අදහස් දැක්වීම් සටහන් කර ගන්නා ලද අතර අනාගත ප්‍රසම්පාදන සැලසුම් කිරීමට ඇතුළත් කරනු ලැබේ. | අදාළ මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ සමඟ අනුකූල වීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ව්‍යාපෘතියේ කාර්යය මණ්ඩලයේ පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් සටහන් කර ගැනීමට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත නොකරන අතර ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතයෙන් පැමිණීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2ක අතිකාල මුදලක් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකාවේ පැවති කොවිඩ් -19 වසංගතය හේතුවෙන් මාස කිහිපයක් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත නොකරන ලදි. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමට පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික හා මූල්‍ය ප්‍රගතිය

තරඟකාරී ලංසු ක්‍රමවේදය යටතේ ව්‍යාපෘතිය සඳහා ආයෝජකයෙකු තෝරා ගැනීම 2016 දී කටයුතු ආරම්භ කර තිබුණද, වර්ෂ 04කට පසු 2020 මැයි 06 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආයෝජකයකු තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවලංගු කර තිබුණු අතර මෙම ආයෝජනය සඳහා සීමාසහිත චයිනා හාබර් ඉංජිනේරු සමාගමේ ආයෝජන යෝජනාව සහ අනෙකුත් ඇල්මැති පාර්ශවයන්ගේ යෝජනා ඇගයීම සඳහා මහාමාර්ග අමාත්‍යාංශයට සහ ආයෝජන මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. කෙසේවෙතත්, 2022 ජුලි 31 දින වන විටත් ව්‍යාපෘතිය විසින් සිවිල් ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කිරීම සඳහා ආයෝජකයකු තෝරා ගෙන නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් දරන ලද මුළු පිරිවැය රු.මිලියන 1,041ක් විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මහා මාර්ගයේ මංතීරු පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ හරහා ඉදිවෙන බැවින් 2022 ජුලි 31 දින වන විටත් රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා කිලෝමීටර් 10.4 මාර්ග කොටස සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කර නොතිබුණි. තවද, ව්‍යාපෘතියට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු පහක් ගොනුකර තිබුණු අතර මෙම නඩු 2022 ජුලි 31 දින වන විටත් විසඳා නොතිබුණි. | පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ව්‍යාපෘතියට එරෙහිව පාර්ශවයන් 5ක් නීතිමය පියවර ගෙන තිබුණු අතර (පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ) එය ව්‍යාපෘතියේ කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රධාන බාධාවක් වේ. | සිවිල් ඉදිකිරීම් කටයුතු පිරිනැමීමට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවලට පෙර මුළු මාර්ග සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ලබා ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | කුලියට ලබාගත් වාහන 17න්, කල්බදු ගිවිසුමේ සැතපුම් ගණන අනුව වාහන 4ක් ඌනඋපයෝජිතව පැවතුණි. තවද, 2020 මැයි 11 දින වාහනයක් අනතුරට ලක්ව තිබුණු අතර 2021 අප්‍රේල් 22 දින රු.528,000 දරමින් අළුත්වැඩියා කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේවෙතත්, එය 2021 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතිය විසින් භාවිත කර නොතිබුණි. | වර්තමානයේ මෙම වාහනයේ සුළු අළුත්වැඩියා කිරීම් කිහිපයක් අවශ්‍ය අතර (බැටරි ප්‍රතිස්ථාපනය, සාමාන්‍ය වාහන සේවාකිරීම (routing servicing vehicle) අළුත්වැඩියා කිරීම් අවසන් වූ පසු මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදෙනු ලැබේ. | ව්‍යාපෘතියේ වත්කම් කාර්යක්ෂමව භාවිත කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.3 ව්‍යාපෘතියේ අරමුණුවලින් බැහැරව කරන ලද ගෙවීම්

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියේ වැඩ විෂයපථයට පටහැනිව, කණු මතින් ඉදිවෙන කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා දිවෙන අධිවේගී මාර්ගයේ සමාරම්භක උත්සවයේ සජීවී ආවරණය සඳහා ව්‍යාපෘතිය විසින් 2021 ජුලි 27 දින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙත එකතුව රු.550,163ක් ගෙවා තිබුණි. | සමාරම්භක උත්සවය සහ දැනුවත් කිරීම් වැඩසටහන් ප්‍රධාන ඇල්මැති පාර්ශවයක් සමඟ 2021දී පවත්වා තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙත සජීවී විකාශනය සඳහා ගෙවීම් සිදුකර තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සමඟ අනුකූලවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.4 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| කණු මතින් ඉදිවෙන මහාමාර්ග ව්‍යාපෘතිය සඳහා ඉඩම් කට්ටි 2,571ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. ඉන් නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කොටසේ රජයේ ඉඩම් කට්ටි 1,110ක් ඇතුලුව ඉඩම් කට්ටි 1,250ක් අත්පත් කර ගැනීමට නියමිත වූ අතර රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා කොටසේ ඉඩම් කට්ටි 1,321ක් අත්පත් කර ගැනීමට නියමිත විය. නව කැළණිය පාලමේ සිට රාජගිරිය දක්වා කොටසේ ඉඩම් කට්ටි 1,334ක් සඳහා 38 (අ) වගන්තිය ගැසට් කර තිබුණද රාජගිරිය සිට අතුරුගිරිය දක්වා කොටසේ මූලික කටයුතු පමණක් සිදුකර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් 17 වගන්ති යටතේ කිසිදු ඉඩම් කට්ටියක් සඳහා වන්දි තක්සේරු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉඩම් කට්ටි 1,334ක් සඳහා 38(අ) වගන්තිය ගැසට්කර ඇත. පාරිසරික බලපෑම් තක්සේරුවට එරෙහිව අභියාචනාධිකරණ (රිට්) අයදුම්පත්‍ර අංක 545/2021 සහ 546/2021 යටතේ 2022/02/21 නිකුත් කරන ලද අභියාචනාධිකරණයේ අතුරු තහනම් නියෝගය අනුව 2022/02/22 දින සිට ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තාවකාලිකව නතර කර තිබුණි. පොරොත්තු රිට් අයදුම්පත විසඳීමෙන් පසු ඉතිරි වැඩ නැවත ආරම්භ කරනු ලැබේ. | ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ලබා ගැනීම අවශ්‍ය වේ. |